# සීමිත සමාගමක ප්‍රාග්ධනය රැස් කිරීම

ප්‍රවීණ ලේඛක
**ඩී.එච්. ඉලේපෙරුම**

ව්‍යාපාර ලෝකයේ ඉතා ජනප්‍රියම ව්‍යාපාර සංවිධානයක් වූ සීමිත සමාගම්වල ප්‍රාග්ධනය රැස්කරන්නේ මහජනතාව වෙත කොටස් නිකුත් කිරීම මඟිනි. ශ්‍රී ලංකාවේ ඒ සම්බන්ධයෙන් බලපාන නීතිය, නව සමාගම් පනත වේ.

කොටසක් යනු සමාගමේ ප්‍රාග්ධනය කුඩා කොටස්වලට බෙදූ පසු ලැබෙන අගය වේ. බොහෝවිට එය රු. 10/- කොටස් වලින් යුක්ත බව පෙනේ. රු 10/- වශයෙන් කොටස් නම් කළ විට එය නාමික අගය ලෙස හැඳින් වේ.

නාමික අගයට ම මහජනතාව වෙත කොටස් නිකුත්කරන්නේ නම් එය සම මිලට කොටස් නිකුත් කිරීම ලෙස හැඳින් වේ. ඊට වැඩි අගයකට නිකුත් කරන්නේ නම් අධි මිල ලෙස ද අඩු අගයකට නිකුත් කරන විට අව මිල ලෙස ද හැඳින් වේ.

සම මිලට හා අධි මිලට කොටස් නිකුත් කිරීම පිළිබඳ සමාගම් පනත මඟින් නීතිමය ආවරණයක් නොමැති වුවත් අව මිලට කොටස් නිකුත් කිරීම සම්බන්ධයෙන් සමාගම් පනතේ 59 වගන්තිය මඟින් පහත විධිවිධාන පනවා ඇත.

(1) උපරිම අව මිල ප්‍රමාණය සමාගමේ මහා සභා රැස්වීමකදී යෝජනාවක් මඟින් සම්මත වී තිබිය යුතු අතර ඒ සඳහා අධිකරණයේ අනුමැතිය ලබා තිබීම.

(2) එම කොටස් දැනටමත් නිකුත් කර ඇති කොටස්වලට අයත් විය යුතු ය.

(3) ව්‍යාපාර ආරම්භ කිරීමේ සහතිකය ලැබී වසරක්වත් ගතවී තිබිය යුතු ය.

(4) අධිකරණයේ අවසරය ලැබී මාසයක් ඇතුළත දී හෝ අධිකරණයේ අවසරය පරිදි ලබාගත් ඊට වැඩි කාලයක් තුළ දී නිකුත් කළ යුතු ය.

මේ අනුව සීමිත සමාගමක් විසින් මහජනතාව වෙත කොටස් නිකුත් කිරීමේ දී සංස්ථා ප්‍රකාශය එනම් මහජනයාට කොටස් මිලදී ගන්නා ලෙස ආරාධනය කරමින් ලිඛිත ප්‍රකාශයක් කළ යුතු ය. එය පුවත්පත් දැන්වීමක් හෝ වෙනත් ජන මාධ්‍යයක් මඟින් කරනු ලැබේ.

මහජනයා විසින් කොටස් සඳහා මුදල් ගෙවිය යුතු අන්දම සමාගම විසින් දෙආකාරයකට දක්වනු ලැබේ.

(1) කොටස් සඳහා ගෙවිය යුතු මුළු මුදලම අයැදුම්පත් සමඟ එකවර ලබා ගැනීම.

(2) කොටස් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල වාරික වශයෙන් ලබා ගැනීම.

ඉහත කුමන ආකාරයකට කොටස් නිකුත් කළත් කොටස් සඳහා ඉල්ලුම්පත් ලද පසු ඒවා බෙදා වෙන් කිරීම පිළිබඳ තීරණය සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය සතු වේ. කොටස් සඳහා ලැබුණු අයැදුම්පත් අතරින් තෝරාගත් අයැදුම්කරුවන් අතර කොටස් වෙන් කිරීම කොටස් විභජනය ලෙස හැඳින් වේ. ඒ බව දන්වා යවන ලිපිය විභජන ලිපිය වේ. කොටස් විභජනය නොකළ අයැදුම්කරුවන්ට කණගාටු ප්‍රකාශිත ලිපිය සමඟ කොටස් මුදල් ආපසු යවනු ලැබේ.

## සම මිලට කොටස් නිකුත් කිරීම

අයැදුම්පත් සමඟ එකවර මුදල් ලබාගැනීම

| | |
|---|---|
| **බැංකු ගිණුම** | හර |
| **සා. කො. අයදුම් හා විභජන ගිණුම** | බැර |
| **සා.කො. අයදුම් හා විභජන ගිණුම** | හර |
| **සා.කො. ප්‍රාග්ධන ගිණුම** | බැර |

කොටස් සඳහා ගෙවිය යුතු මුදල වාරික වශයෙන් ලබා ගැනීම පහත අවස්ථාවන් පරිදි සිදු වේ.

1. අයැදුමේ දී
2. විභජනයේ දී
3. ඇරියුමේ දී

අයැදුමේ දී ලබාගත යුතු මුදල කොටසක නාමික අගයෙන් 5% කට නොඅඩු විය යුතු බවට සමාගම් පනතේ දක්වා ඇත. අයැදුමේ දී ලබාගත් මුදල් ගිණුම් ගත කරන්නේ මෙසේ ය.

| | |
|---|---|
| **බැංකු ගිණුම** | හර |
| **සා. කො. අයදුම් හා විභජන ගිණුම** | බැර |

විභජනය කිරීමේ දී මුදල් ගෙවිය යුත්තේ විභජන ලිපිය සමඟ කැඳවන වාරික ප්‍රමාණය වේ. එය විභජන මුදල වේ. විභජන අවස්ථාවේ දී අයදුම් හා විභජනයට අදළ මුදල කොටස් ප්‍රාග්ධන ගිණුමට බැරකරනු ලැබේ.

| | |
|---|---|
| **සා.කො. අයදුම් හා විභජන ගිණුම** | හර |
| **සා.කො. ප්‍රාග්ධන ගිණුම** | බැර |
| **බැංකු ගිණුම** | හර |
| **සා.කො. අයැදුම් හා විභජන ගිණුම** | බැර |

ඇරියුම යනු කොටස් විභජනය කළ පසු සමාගමට මුදල් අවශ්‍ය අවස්ථාවේ දී නිකුත් කළ කොටස් සඳහා ගෙවිය යුතු ඉතිරි මුදල කොටස් හිමියන්ගෙන් ඉල්ලා සිටින අවස්ථාව වේ. මෙය එක්වරක් හෝ කිහිප වරක් විය හැකි ය. ඒ අනුව ප්‍රථම ඇරියුම, දෙවැනි ඇරියුම ආදී වශයෙන් සඳහන් වේ.

කොටස් ප්‍රාග්ධනය රැස් කරන ආකාරය පිළිබඳ ගිණුම්ගත කරන අන්දම නිදසුන් කිහිපයක් මඟින් විමසා බලමු.

## කොටස් නිකුත් කිරීම මඟින් ප්‍රාග්ධනය රැස් කිරීම

1. සීමිත අරුණ සමාගම රු 10/- කොටස් සා.කො. 70000 ක් කොටසක් රු 16/- බැගින් නිකුත් කරන ලදී. පහත අන්දමට කොටස් සඳහා මුදල් රැස්කර ගන්නා ලදී.

| | රු. |
|---|---|
| අයැදුමේ දී | 6/- |
| විභජනයේ දී (අධි මිල සමඟ) | 8/- |
| පළමු හා අවසාන ඇරියුමේ දී | 2/- |

කොටස් 100,000 ක් සඳහා අයැදුම්පත් ලැබුණි.

| **යදුම්පත් ගණන** | **අයදුම්පතක කොටස් ගණන** | **මුළු කොටස් ප්‍රමාණය** |
|---|---|---|
| 400 | 100 | 40 000 |
| 600 | 100 ට වැඩි | 60 000 |
| | | 100,000 |

අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි කොටස් විභජනය කිරීමට තීරණය කරන ලදී.

කොටස් 100 බැගින් අයැදුම්කරුවන් සඳහා සම්පූර්ණයෙන් විභජනය කරන ලදී.

සෙසු අයැදුම්කරුවන් සඳහා සමානුපාතිකව විභජනය කරන ලදී.

පහත දැක්වෙන අයැදුම්කරුවන් දෙදෙනා හැර ඉතිරි අයැදුම්කරුවන් විසින් ගෙවිය යුතු මුදල නියමිත පරිදි ගෙවා ඇත.

කොටස් 100 ක් අයැදුම් කළ රුවන් විභජන හා ඇරියුම් මුදල් ගෙවා නැත.
කොටස් 600 ක් අයැදුම්කළ සමන් ඇරියුම් මුදල් ගෙවා නැත.
සාදන්න.
(අ) (1) විභජනයේ දී ලැබූ මුදල ගණනය කිරීම
(2) හිඟහිමි ඇරියුම් මුදල ගණනය කිරීම
(3) ඉහත ගනුදෙනු වාර්තා කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් (මුදල් ද ඇතුළුව)
(ආ) විභජන හා ඇරියුම් මුදල් නොලැබූ කොටස් 150 ක් අහිමි කරන ලදී. මේවා එකක් රු 5/- බැගින් නිකුත් කර මුදල් ලබා ගන්නා ලදී. මෙයට අදළ කොටස් අහිමි කිරීම හා ගැනීම සාදන්න.

**විසඳුම**

(1) විභජනයේ දී ලැබූ මුදල් ගණනය කිරීම

| | රු |
|---|---|
| විභජනයේ දී ලැබිය යුතු මුදල (70000 X 8) | 560,000 |
| අඩු අයැදුමේ දී වැඩිපුර ලද මුදල (30000X6) | (180,000) |
| විභජනයේ දී ලැබිය යුතු මුදල | 380000 |
| අඩු : හිඟහිමි මුදල (100X8) | (800) |
| | 379200 |

(2) හිඟහිමි ඇරයුම් මුදල ගණනය කිරීම

| | |
|---|---|
| රුවන්ගෙන් හිඟ මුදල (100X2) | = 200 |
| සමන්ගෙන් හිඟ මුදල (300X 2) | = 600 |
| | 800 |
| ඉල්ලුම් කළ කොටස් ගණන | = 100,000 |
| කොටස් 100 බැගින් ඉල්ලුම් කළ අයට දුන් කොටස් | 40000 |
| කොටස් 100 ට වැඩියෙන් ඉල්ලුම් කළ ප්‍රමාණය | 60000 |
| විකිණීමට ඉදිරිපත් කළ කොටස් | -70000 |
| විභජනය කළ කොටස් | 40000 |
| ඉතිරි අයට විභජනය කළ හැකි කොටස් ගණන | 30000 |
| විභජනය කළ අනුපාතය | 60:30 |
| | 2:1 |
| සමන්ට විභජනය කළ කොටස් 600X1/2 | = 300 |

**කොටස් අහිමි කිරීමේ හා නැවත නිකුත් කිරීමේ ගිණුම**

| | | | |
|---|---|---|---|
| ඇයැදුම් හා විත්ත (හිඟහිමි) | 300 | කොටස් ප්‍රාග්ධනය | 1500 |
| ඇරියුම් (හිඟහිමි) | 300 | අධිමිල | 900 |
| කොටස් ප්‍රාග්ධන ගිණුම | 1500 | මුදල් | 1050 |
| කොටස් අධි මිලට මාරු කළා | 1350 | | |
| | 3450 | | 3450 |

2. සීමිත සමන් සමාගම එකක් රු 10/- ක් හි සා.කො. 60000 ක් එකක් රුපියල් 12/50 බැගින් නිකුත් කළා ය. පහත අන්දමට කොටසක් සඳහා මුදල් රැස්කර ගන්නා ලදී.

| | රු |
|---|---|
| අයැදුමේ දී | 4/- |
| විභජනයේ දී (අධිමිල ඇතුළුව) | 5/50 |
| ප්‍රථම හා අවසාන ඇරියුම | 3/- |

කොටස් 90000 ක් සඳහා අයැදුම්පත් ලැබුණි. පහත සඳහන් පරිදි කොටස් විභජනය කරන ලදී.
සේවකයන් අයැදුම් කළ කොටස් 30000 සම්පූර්ණයෙන් විභජනය කරන ලදී.
ඉතිරි කොටස් සමානුපාතිකව විභජනය කරන ලදී.
සේවකයන්ට විභජනය කළ කොටස් සඳහා සම්පූර්ණයෙන් මුදල් ලැබුණි.
සමානුපාතිකව විභජනය කළ කොටස් අතරින් කොටස් 500 ක් විභජනය වූ සේන ගෙන් විභජන හා ඇරියුම් මුදල් නොලැබුණි. ඉන් කොටස් 200 ක් අහිමිකර ඒවා රු 8/- බැගින් නැවත නිකුත් කර මුදල් ලබාගන්නා ලදී.

**සාදන්න :**
(1) ජර්නල් සටහන් (මුදල් ද ඇතුළුව)
(2) අහිමි කිරීමේ හා නැවත නිකුත් කිරීමේ ගිණුම

## පොදු ජර්නලය

| | රු | රු |
|---|---|---|
| බැංකුව<br>සා.කො. අයැදුම් හා විභජන ගිණුම<br>(කොටස් 100 000 කට කොටසකට රු 6/- බැගින් අයැදුම් මුදල් ලැබීම) | 600 000 | 600 000 |
| සා.කො.අයදුම් හා විභජන ගිණුම හර | 980,000 | |
| සා.කො. ප්‍රාග්ධන ගිණුම | | 560,000 |
| කොටස් අධිමිල ගිණුම<br>(කොටස් 70000 ක් විභජනය කිරීම) | | 420 000 |
| බැංකුව හර | 379 200 | |
| සා.කො. අයදුම් හා විභජන ගිණුම<br>(විභජන මුදල් ලැබීම) | | 379,200 |
| බැංකුව හර | 139 200 | |
| ඇරයුම් ගිණුම<br>ඇරයුම් ගිණුම් ලැබීම සටහන් කිරීම | | 139 200 |

## පොදු ජර්නලය

| | රු | රු |
|---|---|---|
| බැංකුව හර | 360 000 | |
| සා.කො. අයැදුම් හා විභජන ගිණුම | | 360 000 |
| කොටසකට රු 4/- බැගින් | | |
| කොටස් 9000 කට අයදුම් මුදල් ලැබීම) | | |
| සා. කො. අයදුම් හා | | |
| විභජන ගිණුම හර | 570 000 | |
| කොටස් අධිමිල ගිණුම | | 150 000 |
| රු 10/- සා.කො. ප්‍රාග්ධන ගිණුම | | 420 000 |
| (රු 10/- කොටස් 60000 ක් | | |
| විභජනය කිරීම) | | |
| බැංකුව හිඟහිමි විභජන ගිණුම හර | 209250 | |
| ස.කො. අයදුම් හා විභජනය | 750 | 210 000 |
| (ඉතිරි විභජන මුදල ලැබීම) | | |
| ඇරියුම් ගිණුම හර | 180 000 | |
| රු 10/- සා.කො. ප්‍රාග්ධන ගිණුම | | 180 000 |
| (කොටසකට රු 3/- බැගින් | | |
| ඇරියුම් කැඳවීම) | | |
| බැංකු ගිණුම හර | 178500 | |
| හිඟහිමි ඇරියුම හර | 1 500 | |
| ඇරයුම් ගිණුම | | 180 000 |
| (කොටස් 500 කට හැර | | |
| ඉතිරි මුදල් ලැබීම) | | |
| සා.කො. ප්‍රාග්ධන ගිණුම හර | 2000 | |
| කොටස් අධිමිල හර | 500 | |
| කොටස් අහිමි කිරීම හා | | |
| නැ.නි. ගිණුම | | 2500 |
| (සා.කො. 200 ක් අධිමිල සහිතව | | |
| අහිමි කරීම) | | |
| කො. අහිමි කිරීම හා නැ.නි.නි. හර | 900 | |
| හිඟහිමි විභජන ගිණුම | | 300 |
| හිඟහිමි ඇරයුම් ගිණුම | | 600 |
| (අහිමි කළ කොටස් වෙනුවෙන් | | |
| නොගෙවූ ඇරියුම් මුදල් අහිමි කිරීමේ | | |
| ගිණුමට මාරු කිරීම) | | |
| අහිමි කිරීමේ හා | | |
| නැවත නිකුත් කිරීමේ ගිණුම හර | 2000 | |
| රු 10/- 25 කො. ප්‍රාග්ධන ගිණුම | | 2000 |
| (රු. 10/-25 කො. 200 ක් නැවත | | |
| නිකුත් කිරීම සටහන් කිරීම) | | |
| බැංකුව හර | 1600 | |
| අහිමි කිරීමේ හා නැවත | | |
| නිකුත් කිරීමේ ගිණුම | | 1600 |
| (රු 8/- බැගින් නැවත | | |
| නිකුතුවෙන් ලද මුදල් සටහන් කිරීම) | | |
| අහිමි කිරීමේ හා නැවත | | |
| නිකුත් කිරීමේ ගිණුම හර | 1200 | |
| කොටස් අධිමිල ගිණුම | | 1200 |
| (අහිමි කළ කොටස් නැවත | | |
| නිකුත් කිරීමෙන් ඇතිවූ ප්‍රාග්ධන | | |
| ලාබය අධිමිල ගිණුමට බැර කිරීම) | | |

### කොටස් අහිමි කිරීමේ හා නැවත නිකුත් කිරීමේ ගිණුම

| | | | |
|---|---|---|---|
| හිඟහිමි විභජන | 300 | සා.කො. ප්‍රාග්ධන ගිණුම | 2000 |
| හිඟහිමි ඇරියුම | 600 | කොටස් අධිමිල | 500 |
| සා. කො. ප්‍රාග්ධන ගිණුම | 2000 | බැංකුව | 1600 |
| කොටස් අධිමිල | 1200 | | |
| | 4100 | | 4100 |

(3) සීමිත ජයනි සමාගමේ 2006/12/31 දිනට නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය එකක් රු. 10/- බැගින් නි.යා.කො. 500,000 කින් සමන්විත වේ. එදිනට සමාගම් පොත්වල පහත සඳහන් ශේෂයන් ද දක්විණි.

| | රු. |
|---|---|
| කොටස් අධිමිල | 125 000 |
| ප්‍රාග්ධනය නිද සං. අරමුදල | 175 000 |
| පොදු සංචිත ගිණුම | 50 000 |
| ලාභාලාභ ගිණුම (බැර) | 250 000 |

2006/12/31 දිනට පැවති එම සා.කො. 10/- බැගින් ප්‍රසාද නිකුතුවක් කිරීමට අධ්‍යක්ෂවරු තීරණය කර ඇත. අදළ ජර්නල් සටහන් හා ලෙජර් ගිණුම් සාදන්න.

## පොදු ජර්නල්

| | රු | රු |
|---|---|---|
| කොටස් අධිමිල ගිණුම හර | 125000 | |
| ප්‍රා. නිද. සං අරමුදල් ගිණුම හර | 175000 | |
| පොදු සංචිත ගිණුම හර | 50000 | |
| ලාභලාභ ගිණුම හර | 150000 | |
| ප්‍රසාද කොටස් නිකුත් කිරීමේ ගිණුම | | 500 000 |
| (රු 10/- සා. කො. 10:1 බැගින් ප්‍රසාද | | |
| නිකුතුවක් කිරීමට අවශ්‍ය අරමුදල් | | |
| සංචිතවලින් ලබා ගැනීම) | | |
| ප්‍රසාද කොටස් නිකුත් කිරීමේ | | |
| ගිණුම හර | 500 000 | |
| සා.කො. ප්‍රාග්ධන ගිණුම | | 500 000 |

**(රු 10/- සා. කො. 50000 ක් ප්‍රසාද කොටස් ලෙස නිකුත් කිරීම සටහන් කිරීම)**

## ප්‍රසාද කොටස් නිකුත් කිරීමේ ගිණුම

| | | | |
|---|---|---|---|
| සා.කො. ප්‍රා. ගිණුම | 500 000 | කොටස් අධිමිල | 125 000 |
| | | ප්‍රා.නි.සං.අ. | |
| | | ගිණුම | 175 000 |
| | | පොදු සංචිත ගිණුම | 50 000 |
| | | ලාභලාභ ගිණුම | 150 000 |
| | 500 000 | | 500 000 |

### සා.කො. ප්‍රාග්ධන ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය ප/ගෙ | 5500 000 | ශේෂය ඉ/ගෙ | 5000 000 |
| | | ප්‍ර.කො.නි. ගිණුම | 500 000 |
| | 5500 000 | | 5500 000 |
| | | ශේෂය ඉ/ගෙ | 5500 000 |